නිපුණතාව 7.0 - මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම 7.5 - ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කාර්යභාරය විමසයි.

- මූල්‍ය පද්ධතියක් යනු දේශීය හා විදේශීය කුටුම්භ,ව්‍යාපාරික ආයතන,රජය යන ප්‍රධාන ආර්ථික ඒකකයන්ගේ මූල්‍ය තීරණයන් ක්‍රියාත්මක කරන වෙළෙඳපොළවල්,මූල්‍ය ආයතන,මූල්‍ය උපකරණ සහ මූල්‍ය යටිතල පහසුකම් යනාදියෙහි එකතුවකි.

<u>මූල්‍ය පද්ධතියේ සංරචක</u>

1.මූල්‍ය ආයතන
2.මූල්‍ය වෙළෙඳපොළ
3.මූල්‍ය උපකරණ
4.මූල්‍ය යටිතල පහසුකම්
5.මූල්‍ය ආයතන අධීක්ෂණය කරන නියාමන ආයතන

- මූල්‍ය ආයතන යනු විවිධ මූල්‍ය උපකරණ ආශ්‍රිත ගනුදෙනුවල යෙදී සිටින විවිධ මූල්‍ය සේවාවන් සපයනු ලබන ආයතනයන්ය.

ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන ව්‍යුහය ප්‍රධාන වශයෙන් කොටස් හතරකින් සමන්විත වේ.

1.ශ්‍රී ලංකාවේ මහ බැංකුව
2.අතරමැදි මූල්‍ය ආයතන
3.මූල්‍ය සේවා සපයන ආයතන
4.මූල්‍ය අධීක්ෂණය හා නියාමන ආයතන

<u>අභ්‍යාස</u>

1.ශ්‍රී ලංකාවේ ඇති අතරමැදි මූල්‍ය ආයතන 5ක් නම් කරන්න.
2.තැන්පතු භාර ගැනීමට හා එමගින් බැංකු කටයුතු කිරීමට අවසර ලබා ඇති මූල්‍ය ආයතන 5ක් නම් කරන්න.
3.මූල්‍ය වෙළෙඳපොළ යනු කුමක්ද?එහි ප්‍රධාන අංශ 2 මොනවාද?